<u>භාණ්ඩ හා සේවා පාරිභෝජනයෙන් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් වන ආකාරය පෙන්වා දෙයි.</u>

- මිනිසුන්ට ජීවත්වීම සඳහා අවශ්‍ය කෙරෙන මූලිකම දෑ අවශ්‍යතා නමින් හැඳින්වේ.

උදා - ආහාර

ඇඳුම් පැළඳුම්

නිවාස

- අවශ්‍යතා ඉටු කර ගන්නා විවිධ ස්වරූප වුවමනා නම් වේ.

නිදසුන් - අවශ්‍යතා - ආහාර

වුවමනා - බත්,පාන්,ඉඳිආප්ප,රොටී

- ආර්ථික විද්‍යාවේදී භාණ්ඩයක් ලෙස හඳුන්වන්නේ ධන තෘප්තියක් හෙවත් උපයෝගිතාවක් ලබා දෙන ඕනෑම දෙයකි.

<u>සම්පත්</u> - මිනිස් වුවමනා තෘප්තිමත් කර ගැනීම සඳහා අවශ්‍ය කෙරෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට යොදා ගත හැකි සියලුම නිෂ්පාදන සාධක සම්පත් නමින් හැඳින්වේ.

සම්පත් ස්වරූප දෙකකි.එනම්,

<u>1.ආර්ථික සම්පත් -</u>සමාජයේ අසීමිත වුවමනාවලට සාපේක්ෂව සැපයුම සීමාසහිත හෝ හිඟකමක් ඇති හෝ සම්පත්

<u>2.ආර්ථික නොවන සම්පත්-</u>ස්වභාව ධර්මයෙන් නොමිලේ ලැබෙන හා ආවස්ථික පිරිවැයක් නොදරන සම්පත් මෙන්ම නිෂ්පාදනය සඳහා යොදා ගත හැකි හිඟකමක් රහිත සම්පත් ආර්ථික නොවන සම්පත් වේ.

<u>අභ්‍යාස</u>

1.අවශ්‍යතා හා වුවමනා අතර ඇති වෙනස්කම් තුනක් ලියන්න.

2.වුවමනා වර්ග කළ හැකි ආකාර දෙක නම් කරන්න.

3.ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩ උදාහරණ සහිතව පහදන්න.

4.ස්වාභාවික සම්පත් අසීමිතව භාවිතයට ගැනීම නිසා ගෝලීය වශයෙන් මුහුණ පෑමට සිදුවන ගැටළු 5ක් ලියන්න.